# දෛනික සිදුවීම් ආශ්‍රිත ක්ෂණික නිරූපණයේ යෙදෙමු.

එදිනෙදා ජීවිතයේ දී අප විවිධ අත්දැකීම් වලට මුහුණ දෙනු ලැබේ. සොම්නස් සහගත අවස්ථා, දොම්නස් සහගත අවස්ථා, හාස්‍යමය අවස්ථා, විශ්මය ජනක අවස්ථා, ජුගුප්සාජනක අවස්ථා ආදී සුවිශේෂී අවස්ථා ඒ අතර වේ.

උදා:

- විභාග ජය
- මංගල
- අවමංගල
- ත්‍යාග ලැබීම්
- නවකතා
- සුරතලා මිය යාම
- තම සතු වටිනා දෙයක්විභා නැතිවීම

ඔබ අත්දැක ඇති මෙවැනි අවස්ථා ක්ෂණික නිරූපණ මගින් ඉදිරිපත් කළ හැකිය.ඊට අමතරව පුවත්පත් වාර්තා ආදිය ද අපට නාට්‍ය නිර්මාණ සඳහා යොදගත හැක.

නමුත් එදිනෙදා සිදුකරන සියලුම ක්‍රියා තුළ නාට්‍යමය රසයක් නොමැත. එවැනි නාට්‍යමය රසයෙන් අනූන සිද්ධි තෝරා ගැනීමට ඔබ සමත් විය යුතුය. එසේ නොවන සිද්ධි වුවද නාට්‍යාකාරයෙන් රගදැක්වීමට ඔබ සමත් විය යුතුය.

ක්ෂණික නිරූපණයක් යනු පෙර සූදානමකින් තොරව ඉදිරිපත් කරන සිදුවීමකි. එදිනෙදා ජීවිතයේ මුහුණදෙන සිදුවීම් ඇසුරෙන් එම නිර්මාණ සිදුකිරීම නාට්‍යක සාර්ථකත්වයට හේතු වේ.

පැවරුම් :

දෛනික ජීවිතයේ දී ඔබට මුහුණ දීමට සිදුවන ක්ෂණික නිරූපණ සඳහා යොදාගත හැකි නාටෝචිත අවස්ථා ලැයිස්තුගත කරන්න.